අබරාගේ භූමිකාව සහ ෆොන්සේකා ගේ පරාජය

අබරා දේශපාලනය පිළිබඳ මළපොතේ අකුරක් දත් අයෙක් නොවේ. එහෙත් යුධ ජයග්‍රහණයෙන් ඔද්දල් වූ අබරා දේශපාලනයට ඇවිත් ලොකු පුටුවම ගැහීමට සිතුවේය. දිගින් දිගටම පරාජය ලැබූ එහෙත් දේශපාලනය පිළිබඳව අවබෝධය ඇති චන්ද්‍රිකාවියන් රැළක්, අබරාව මුල් තැනටම ගෙන ඔහු දේශපාලනයට යොමු කළේය. එහෙත් දේශපාලනය පිළිබඳ නොදත් අබරා "ඈ ඕයි දේශපාලනය කරන්නේ කොහොමදැයි" ඔවුන්ගෙන් ඇසුවේය. "ඒක බොහොම ලේසියි අබරෝ... උඹට තියෙන්නේ අපි කියන කියන එක ස්ටේජ් එකට නැගලා කියන්නයි" ඔවුන් කීවෝය. සුදු සරමකින් හා සුදු බැනියමකින් සැරසුණු අබරා ජනතාව අතරට ගියේය. ස්ටේජ් එකට නැගගත් අබරා වග විභාගයක් නැතිව වටේ සිටින චන්ද්‍රිකාවියන් කියන කියන එක කියවන්නට පටන් ගත්තේය. කැණහිලා, පිස්සා, බූරුවා, තෝ, මූ, අරෑ, කටු ලෙවකෑම ආදී වචන කේන්තියෙන් පිටකර දැමූ අබරා දේශපාලනය කරන ක්‍රමය එයයැයි සිතුවේය. මේවා අසා සිටි ජනතාව "කොහෙද යන පිස්සෙක්" යැයි හොල් මිමිණුවෝය. මෙය ඇසුණු අබරා ජනතාවටද එසේම කීවේය. මෙයින් කෝපයට පත් ජනතාව, අබරාව දේශපාලන පොර පිටියෙන් එළවා දැමුවේය. බොහෝ අමාරුවෙන් පරාජය බාර ගෙන එළියට පැනගත් අබරා දින 40 ක් දේශපාලනය කරලා මෙච්චර අමාරු නම් අවුරුදු 40 ක් කළොත් මගේ කටුක් ඉතිරි වෙන එකක් නැතැයි සිතමින් සුදු බැනියම සරම ගලවා කෝට් එක ඇඟලා ගෙන නැවත ගෙදරට බඩ ගෑවේය.

සිංහල සාහිත්‍යය අපූරු ජනකතා රාශියකින් පිරී ඇති බව ඔබ දනිතැයි මම සිතමි. එහි එන අබරා සිල් ගත්තා වාගේ ජනකතාව හා ඉහත කතාව සංසන්දනය කර බලන්න. සරත් ෆෝන්සේකා මහතාටද සිදු වී ඇත්තේ එයමය. ඔහු ජාත්‍යන්තර අතකොළුවක්වත්, විදේශ බලවේග විසින් රජය පෙරළා දැමීමට යොමු කළ බළලුන් අතක්වත් නොවේ. අබරා මෙන්ම ඔහු කළේ ඔහුට සිතුණු දේය. අබරාගේ බිරිඳ කීවේ "සිල්ගන්න එක ලේසියි. පමුසෙට තියෙන්නෙ හාමුදුරුවො කියන කියන එක කියන්නයි" යනුවෙනි. මෙහිදී හාමුදුරුවන්ගේ භූමිකාව රඟපෑවේ රනිල්, මංගල, ටිල්වින් සමාගමයි. එහෙත් අවසානයේදී රටේ මහජනතාව සැබෑ හාමුදුරුවන්ගේ භූමිකාව රඟපෑවේය.

සරත් ෆෝන්සේකා පරාජය වූයේ මහින්ද හොඳ නිසා නොවේ. ඔහු නරක නිසාය. මා මෙහිදී "නරක" යනුවෙන් අදහස් කළේ ඔහු දේශපාලන පොර පිටියේ රඟ පෑ ආකාරය නිසාය. අඩු තරමින් ඔහු වේදිකාවක කතා කරන ආකාරයක්, ජනතාව අමතන ශිෂ්ඨ වාග් මාලාවක් වත් හරිහැටි නොදැන සිටියේය. රනිල්ට කතා කරන හැටි කියාදුන්, ඒ පිළිබඳව පන්ති පැවැත්වූ අනෝජා වීරසිංහවත් ඔහුට මෙවර නොසිටියේය. ඔහු දේශපාලන ගැට නොහොත් සාමාන්‍ය ජනතාව අතර ව්‍යවහාර වන "මොත්තෙ" පිළිබඳව අනවබෝධයෙන් ක්‍රියා කළේය. අඩුතරමින් දත් පෙන්නා මුව විදහා සිනාසෙන ඡායා රූපයක්වත් ගන්නට හා එය බිත්තිවල අලවන්නට උපදෙස් දිය හැකි නායකත්වයක් ඔහු වටා නොසිටියේය. හිතට එන දේ අවංකවම මුවින් පිට කර දැමූ ෆෝන්සේකා දේශපාලනයද විනය ගරුක පිරිසක් සිටින (හමුදාව සේම) සුදු ඇඳුම සේම වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම සුදු, එය යුතු තෝතැන්නක් යැයි සිතුවේය. මීට පෙර සිනමාව තුළින් දේශපාලනයට එිත් රටේ ඉහළ ජනප්‍රියත්වයක් ඉසිලූ විජය කුමාරතුංග ද සිතුවේ දේශපාලනයද සිනමාව සේම සුදු පාට මීදුම් ගලන මනස්කාන්ත තෝතැන්නක් ලෙසය. යන්තම් ජීවිතය නේරාගෙන මාස දෙකක් තිස්සේ ෆෝන්සේකා නාගත් මඩ කන්දරාව සේදීමට දැන් ඉතින් කාටවත් බැරිය. තමන්ට ආ මඩ ෆෝන්සේකා පිට දැමූ රනිල් මෙවර මහින්දටත් වඩා හොඳින් ජයග්‍රහණය කළේය. දැන් ඉතින් ඔහුට නොබීයව තව වසර අටක් ඊජිප්ත නායක ධූරයේ සිටිය හැක. එදා ප්‍රභාකරන් "කපටි හිවලා" ලෙස හැඳින්වූ රනිල්ව, තව නොබෝ දිනකින් ෆොන්සේකාට එලෙසම ඇමතිය හැක.

සරත් ෆෝන්සේකා පරාජය වූයේ මහින්ද හොඳ නිසා නොවේ. ඔහු නරක නිසාය. මා මෙහිදී නරක යනුවෙන් අදහස් කළේ ඔහු දේශපාලන පොර පිටියේ රඟ පෑ ආකාරය නිසාය. අඩු තරමින් ඔහු වේදිකාවක කතා කරන ආකාරයක්, ජනතාව අමතන ශිෂ්ඨ වාග් මාලාවක් වත් හරිහැටි නොදැන සිටියේය. රනිල්ට කතා කරන හැටි කියාදුන්, ඒ පිළිබඳව පන්ති පැවැත්වූ අනෝජා වීරසිංහවත් ඔහුට මෙවර නොසිටියේය.



දූෂණය පිළිබඳව මඩ ලැයිස්තුවක්ම නාගත් මහින්දට මෙවර ලැබී ඇති ජනවරම අති විශිෂ්ඨ ජයග්‍රහණයක් නොවේ. ඔහු තම නිර්දෝෂීභාවය විහිවිඳ භාවයකින් යුතුව අඳින් පටන් ඔප්පු කර නොපෙන්වුවොතින් ඔහුගේ පරාජයේ ආරම්භයද මෙය වීය හැක. නාස්තිය දූෂණය පිටු දැක රට නිවැරදි මඟකට ගන්නා බවට ඔහු දුන් පොරොන්දුව ඉටු කර මේ වසර අට තුළ රට සංවර්ධනය කිරීමට ඔහුට දිගු කාල පරාසයක් ලැබී ඇත. ඔහුට මේ ජනවරම ජනතාව ලබාදී ඇත්තේ "දූෂණය සියයට සියයක්ම නැති කරමින් රට සංවර්ධනය කරපන්" මහින්ද කියා නොවේ. "දූෂණය අවම කර රට ගොඩනගපන්" කියාය. ඒ ගාගත් මඩ නිසිලෙෂ සෝදාගතහොත් මහින්දට රපෝක් ලෙස වැජඹිය හැක.

මෙම මැතිවරණය වෙනුවෙන් දෙපිළම නාස්ති කල මුදල් කන්දරාව දෙස බැලුවහොත් එය අති විශාල මුදල් කන්දකි. කතිරය ගසූ ජන්ද කොළ සේම කන්දකි. රුපියල් කෝටි 45 ක මුදලක් ප්‍රචාරක කටයුතු සඳහා වැය කර ඇති ප්‍රධාන පක්ෂ දෙක මීට වඩා අපේ රටේ බදු ගෙවන දුප්පත් ජනතාව ගැන සිතිය යුතුවේ. කුසට අහරක් ඉතට වතලක් නැති ජනතාව වෙනුවෙන් මෙම මුදල් වැය කිරීමට අවස්ථාවක් ලදී නම් එය කෙතරම් අගේද? ඕස්ට්‍රේලියාව වැනි සංවර්ධනය වූ රටවල ජන්දය හෙත් දෙකින්ම දැක ඇති අපිට අපේ රට ගැන දැනෙන වේදනාව කියා නිම කළ නොහැක. ප්‍රචාරක කටයුතු සඳහා අවම මුදලක් යට කරන මෙවැනි රටක ආදර්ශය අප රටටත් ගත හැකි නම් එය කෙතරම් අර්ථාන්විත වෙනු ඇත්ද?

අපේ රටේ ජන්දය හිමි ජනතාවගෙන් 70% ක් පමණ ජන්දය පාවිච්චි කර ඇති මෙවර ජනාධිපතිවරණය, ආණ්ඩු පක්ෂය සිතූ තරම් 6ද ක ප්‍රතිශතයක් ඉක්මවා යෑමට නොහැකි වූයේ මහිඳ යන්න ඔවුන්ට සිතා බැලීමට නිසි කල දැන් එළඹ ඇත. රජයේ මාධ්‍යය ඇතුළු මුළු ප්‍රචාරක ජාලය ශක්තිමත්ව තිබියදීත් ජනතාව ඒ දෙසට නමස්ශීලී නොවූයේ ඔවුන් අද මාධ්‍යය පිළිබඳව එතරම් විශ්වාසයක් නොමැති නිසාය. මහින්ද ලබාගත් 58% ක ප්‍රතිශතය අපේ රටේ ගමේ ගොඩේ ජීවත් වන අහිංසක මිනිසුන්ගේ ජන්දවලින් ලබා ගත් ප්‍රතිශතයකි. කුස ගැන නොව රට ගැන සිතන ගැමි ජනතාවක් අපට තවම ඇත. ඔවුන් අද හාල් සේරුවක්, පෙට්‍රල් ලීටරයක් ගැන සිතන්නේ නැත. උපරිම වීරු කියාවෙන් පෙළෙන්නේ ඔවුන්ය. මහින්ද චින්තන යටතේ අහිංසක ගැමි ජනතාවට සේම උතුරේ අසරණ වැසියන් ගැනද උපරිම තලයෙන් සිතා බැලිය යුතුය. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව කළකිරී සිටින යාපනයේ ජනතාව වෙත සිංහල නායකයින් තව තවත් ලංවීය යුතු බව මෙම ජන්ද ප්‍රතිඵලවලින් කියාපායි.

සුදුමයකි. මෙම ප්‍රතිඵල තුළින් යූ ඇන් පීයටත් වඩා පේ ඒ පීයට කදිම පාඩමක් ජනතාව උගන්වා ඇත. මෙසේම ඉදිරියට ගියහොත් පේ ඒ පී යටද සිදු වන්නේ සම සමාජ පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය සේම බෝඩ් ලැල්ලකට සීමා වන්නටය. පේ ඒ පී යටත් වඩා සියයට සියයක්ම අවංක විත්තමිබාහු වැන්නවුන්ට අත්වූ ඉරණම සේම ඉරණමක් පේ ඒ පී යට අත් වීම වැළැක්වීමට නම් එම නායකයින් අනුන්ට කඩේ යාම නවත්වා තමන්ගේ පැහැදිලි ප්‍රතිපත්ති රැගෙන ජනතාව අතරට යා යුතුය. ඒ ප්‍රධාන පක්ෂ දෙකේම ප්‍රතිපත්ති බොහෝ දුරට සමාන නිසා, ඊට වෙනස් ප්‍රතිපත්තියකට ජනතාව පෙළ ගැසෙන කාලය වනතුරු සුළු පක්ෂයක් වශයෙන් පේ ඒ පී ය තව තවත් ඉවසිය යුතුය. ධනවාදයටවත්, සමාජවාදයටවත් සැමදා එක ලෙස රැඳිය නොහැක. කලින් කල ලෝකය තුළ මෙම වාදයන් දෙක වෙනස් වන්නේ ඒ නිසාය. එහෙත් ප්‍රජාතන්ත්‍රවාදය දේශපාලන ලෝකයේ මුරගලයි. එය එක තැන තිබ්වලව සැමදා රැඳෙයි. එහෙයින් පේ ඒ පී ය අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට ගැලපෙන අළුත් මඟක් සොයාගත යුතුය. දේශපාලනමය අවබෝධයක් නොමැති සරත් ෆෝන්සේකා දේශපාලන ලෝකයට කැන්දාගෙන එත් ගෙනගිය දේශපාලන ප්‍රයෝග පිළිබඳව අපේ රටේ ජනතාවට හොඳ ඉවක් ඇත. එම ඉව පිළිබඳව ජනතා විමුක්ති පෙරමුණ ක්‍රියා කරන ආකාරය එයවුල්ය. ජනතාව එය තේරුම් ගත්තෝය.

මේ සියලු කාරණා සළකා බැලීමේදී කුන්තාහී ජාතකයෙන් අපට ලබා දෙන පණිවිඩය අද රටේ දේශපාලන ලෝකයටද හොඳින් ගැලපේ. පළිගැනීමේ අදහස්වලින් පිරී පොදු අපේක්ෂකයා පිළිබඳව ජනතාව හොඳින් අවබෝධ කර ගත්තේය. එහෙත් පළිග ැනීම් අරමුණුවලින් පිරී යමෙක් යමක් කරයිද නැත්නම් එය කිරීමට සිතයිද ඔහුට කවදා හෝ පසුතැවිලි වීමට සිදුවේ.

මේ ජන්දයෙන් ඔහු ලබාගත් පසුතැවිල්ල ඕයෙනතුරාම ඔහු ලඟ රැඳෙනු ඇත.

ලක්ෂ්මන් කොඩිතුවක්කු

ඔබේ උත්සව අවස්ථාවට
Hennessy Catering Services
රස ගුණ පිරි ආහාර සපයන්නෝ
බුරියානි
කහ බත්
ෆ්‍රයිඩ් රයිස්
ආප්ප
කොත්තු
වෙනත් ඕනෑම කෑමක්

ලොකු පොඩි ඕනෑම භාදයකට උත්සවයකට
15 Hennessy St Epping 3076
Tel 03 8320 3932
Mobile 0432 721 967